**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය ( අතිරේක මූල්‍යනය) - 2014**

---------------------------------------------------------------------------------

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මූල්‍යනය) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2011 ඔක්තෝබර් 04 දින එළඹි අංක 2767 - එස්ආර්අයි දරන ණය ගිවිසුමේ ii ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

------------------------------------------------------------------------------------------

ණය ගිවිසුම අනුව එවකට මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ජාතික මහාමාර්ග කිලෝමීටර් 60 ක පමණ පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම්, වැඩිදියුණු කිරීම මගින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,728 කට සමාන එජඩො මිලියන 105.60 ක් වූ අතර ඉන් රු. මිලියන 11,050 කට සමාන එ.ජ.ඩො මිලියන 85 ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට නිම වූ, ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක 2217 එස්ආර්අයි දරන ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලද ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය නම් වූ සමගාමී ව්‍යාපෘතිය සඳහා අතිරේක මූල්‍යයනයක් සැපයීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘති ද්විත්වයම එකම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් විසින් පරිපාලනය කෙරෙන නමුත් අදාළ ව්‍යාපෘතින් වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වෙනම ඉදිරිපත් කර තිබුණි. මෙම ව්යාපෘතියේ කටයුතු 2011 දෙසැම්බර් 14 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 දින නිම කිරීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමණාකරනයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණන මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණන සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත් , වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැඟීමට පත්වන සතුටුදායක ලෙස සසදා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජියතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුනේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

**2.2.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

පහත සඳහන් නොපිළිපැදීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 8.3.9 හා 8.6 ඡේද අනුව දීමනා ලබාගැනීමට ව්‍යාපෘති සේවකයින්ට අදාල නොමැති

වුවත්, ව්‍යාපෘතියට අනුයුක්ත මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට විශේෂ දීමනා හා වෛද්‍ය නිවාඩු මුදල් පිළිවෙලින් රු.9,918,622 හා රු.776,316 චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) 2007 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නිකුත් කළ අංක 33 චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව ව්‍යාපෘතියට අනුයුක්ත කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන්ගේ වැටුප් මාර්ග සංවර්ධන අධිකාරිය හඳුන්වාදුන් සූත්‍රයන් පදනම් කරගෙන ගෙවීම පරිචයක් ලෙස සිදු කර තිබුණි.

(ඇ) ඊට අමතරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව නිකුත් කළ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛණයේ 8.3.9 ඡේදයට පටහැනිව පොදුකාර්ය වියදම් ලෙස රු.2,354,794 ක් ව්‍යාපෘතිය මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රේෂණය කර තිබුණි.

## 3.1. අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යනය සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, හා සමාලෝචිත වර්ෂයේ අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම් | | 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රුපියල් මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රුපියල් මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රුපියල් මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 85.0 | 11,050 | 22.6 | 2,939.3 | 51.2 | 6,661.9 |
| ශ්‍රී ලංකා රජය | 20.6 | 2,678 | 6.7 | 867.7 | 24.5 | 3,188.1 |
| | 105.6 | 13,728 | 29.3 | 3807.0 | 75.7 | 9,850.0 |

ඉහත තොරතුරු අනුව ව්‍යාපෘති කාලයෙන් වර්ෂ 3 ඉකුත් වූ පසු ණය ලැබීම් වලින් සියයට 60 පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරිව තිබෙන වර්ෂ 1ක ව්‍යාපෘති කාලය තුළ ණය ශේෂයේ ඉතිරිය උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිතය.

**3.2 භෞතික ප්‍රගතිය**

--------------------

ලැබී ඇති තොරතුරු අනුව පුනරුත්ථාපන වැඩ කරගෙන ගිය ජාතික මාර්ග 06 ක 2014 දෙසැම්බර් 31 දින භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| මාර්ගය | මාර්ග දුර කිලෝමීටර් | 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| | | % |
| මාතර - ගොඩගම | 3.40 | 100.00 |
| හික්කඩුව - දකුණු අධිවේගී මාර්ගය | 14.34 | 62.34 |
| අලුත්ගම - දකුණු අධිවේගී මාර්ගය | 11.07 | 69.05 |
| කටුකුරුන්ද - නාගොඩ | 2.72 | 100.00 |
| කිරුලපන - ගොඩගම | 13.3 | 57.81 |
| පාමංකඩ - කැස්බෑව | 12.76 | 58.2 |
| එකතුව | **57.59** | |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කිරුළපන - ගොඩගම මාර්ගයේ පුනරුථාපන වැඩ 2013 ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබූ අතර අවශ්‍ය මැෂින් වැඩ බිමට ගෙන ඒමේ ප්‍රමාදය, වෙනත් යන්ත්‍ර උපකරණ හා ශ්‍රම බලකාය ආදිය හේතුවෙන් වැඩ ආරම්භක කිරීම තවදුරටත් 2014 දක්වා ප්‍රමාද විය. සත්‍ය විෂය පථයට සරිලන පරිදි සංශෝධිත වැඩ සටහන් කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කර නොතිබුණු අතර එය කාලය දිගු කිරීම හා කොන්ත්‍රාත්තු පිරිවැය ඉහළ යෑමට බලපෑ හැකිය.

(ආ) පාමංකඩ කැස්බෑව මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සඳහා කොන්ත්‍රාත්තු ගිවිසුම 2012 ඔක්තෝබර් මස 1 දින අත්සන් කර ඇතත්, පියවර 1 කොන්ත්‍රාත්තු වැඩබිම මාස 06 ක ප්‍රමාදයකින් පසු 2013 මාර්තු 25 දින කොන්ත්‍රාත්කරුට භාර දෙන ලදි. මාර්ගයේ පියවර 2 වැඩබිමේ භාරකාරීත්වය භාරදීම තවත් මාස 2ක් ප්‍රමාදවී 2014 මැයි 20 දින කොන්ත්‍රාත්කරුට භාරදී තිබුණි. තවද, ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීම හා මාර්ගයේ උපයෝගී සේවාවන් වෙනස් කිරීමට පෙර ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ සටහනට අනුව වැඩ ආරම්භ කිරීමට කොන්ත්‍රාත්කරු අසමත් වී තිබුණි.

## 3.3 කොන්ත්‍රාත්තු පරිපාලනය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර - ගොඩගම මාර්ගයේ පුනරුත්ථාපන වැඩවල ප්‍රමාණයන් සැලකිය යුතු ලෙස වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස වැඩවල පිරිවැය මිලියන 14 කින් වැඩි වී තිබුණි. තවද වැඩ විෂය පථයට ඇතුළත් නොවූ මාතර රාහුල විද්‍යාලයේ මායිම් තාප්පය ඉදිකිරීමට රුපියල් මිලියන 14 සහ ජලනල පද්ධතිය නැවත ස්ථානගත කිරීමට රුපියල් මිලියන 25 ක වැඩ ව්‍යාපෘතිය කරගෙන ගොස් තිබුණු අතර එය වැඩ විෂය පථයට ඇතුළත් වි නොතිබුණි.

(ආ) පාමංකඩ - කැස්බෑව මාර්ගයේ පුනරුත්ථාපන වැඩ සම්බන්ධව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. ප්‍රාරම්භක හා පොදු වැඩ විෂයයන් සඳහා එකවර ගෙවීම් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු.මිලියන 145.33 ක් වුවද, කොන්ත්‍රාත්කරු විසින් එම වැඩ සඳහා රු.මිලියන 256 ක මුදලක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව අනුමත කිරීමට පෙර ගාස්තු රේට් ප්‍රමාණයන් පිළිබඳ විශ්ලේෂණයක් කර නොතිබුණි.

ii. 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සියළු ප්‍රසම්පාදනයන් සඳහා ඇස්තමේන්තු , ප්‍රසම්පාදනයේ මුළු පිරිවැයෙහි නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා වන සියළුම කරුණු සැලකිල්ලට ගනිමින් සැකසිය යුතුය. කෙසේ වුවද, රු. මිලියන 660.9 ක්වූ පාමංකඩ කැස්බෑව මාර්ගයේ කොටස් දෙකක පුනරුත්ථාපන වැඩ හා රු. මිලියන 95 ක් වූ පාමංකඩ පාලමේ පිරිවැය ප්‍රථම ඇස්තමේන්තුවෙන් ඉවත් කරගෙන තිබූ අතර රත්තනපිටිය නව පාලමෙහි පිරිවැය තීරණය කර ගැනීමෙන් තොරව ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණි. තවද අමාත්‍යාය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය, විෂය පථය වෙනස් කිරීම් සඳහා ලබා ගෙන නොතිබුණි.

iii. කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි 14.6 අනුව, ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් අවම වටිනාකම රු. මිලියන 66.4 කට සීමා විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද එකතු රු.මිලියන 487 අතුරු ගෙවීම් අවස්ථා 22 න් අවස්ථා 12 කදී අවශ්‍ය අවම සීමාව කරා එළඹ නොතිබුණි.

(ඇ) හික්කඩුව - දකුණු අධිවේගී මාර්ගය වැඩි දියුණු කිරීමේ වැඩ කරගෙන යෑමේදී ඉංජිනේරුවන්ගේ පහසුකම් සැපයීම හා ජාතික ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල නල වෙනස් කිරීම, ප්‍රාදේශිය පළාත් අධිකාරියේ කළ යුතු සංවර්ධන හා යටිතල පහසුකම් ආදිය සඳහා රුපියල් මිලියන 74.82 ක් වැය කර තිබුණි. එකී කාර්යයන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලට අදාල නොවුණි.

ඊට අමතරව, මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, හික්කඩුව හා ගෝනුපිනුවල තැපැල් කාර්යාල මායිම් තාප්ප වැඩ සඳහා රුපියල් මිලියන 5.74 වැයවී තිබුණු අතර එකී කාර්යයන් ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලට අදාල නොවුණි.

**3.4 <u>මතභේදයට තුඩුදෙන කරුණු</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) දේශීය උපදේශකවරුන්ගේ පත්වීම් ලිපි අනුව පාරිශ්‍රමිකයින් හැර වෙනත් දීමනා වලට හිමිකම් නොමැති වුවත් ඉන්ධන දීමනාව හා ගමන් වියදම් වශයෙන් පිළිවෙළින් මිලියන 2.88 හා මිලියන 1.42 සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘතිය ගෙවා තිබුණි.

(II) මාතර - ගොඩගම මාර්ගය පුනරුත්ථාපනය සඳහා පිළියෙල කරන ලද ප්‍රමාණ බිල්පත් වලට අනුව දික් මීටර් 8,470ක කර්බ් (Curbs) සවිකිරිමට අවශ්‍ය වී තිබුණි. කර්බ් දික් මීටරයක් රු.2,500 බැගින් දික් මීටර් 2,198 සවිකර රුපියල් මිලියන 5.49 ගෙවා තිබුණි. කෙසේ වෙතත්, ඉතිරි දික් මීටර 6,272 ක කර්බ් පසුව සවිකර දික් මීටරයක් සඳහා රුපියල් 3745 රේට් ගණන් මත රුපියල් මිලියන 23.49ක් විචලන නියෝග 02 කින් ගෙවා තිබුණි.

(III) ව්‍යාපෘති කටයුතු සඳහා යොදවා නොගත් මෝටර් වාහන සඳහා රුපියල් මිලියන 2.35ක් ඉන්ධන සඳහා වැයකර තිබුණි.

(IV) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ කාර්යමණ්ඩලය සඳහා නේවාසික පහසුකම් සැපයීමට කෝන්ත්‍රාත්කරු බලාපොරොත්තු නොවූවත් මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරුන් සඳහා නේවාසිකාගාරයක් සපයා ඒ සඳහා රු.මිලියන 4.64 කුලී ගෙවා තිබුණි.

(V) ලැබී තිබුණු තොරතුරු අනුව කැස්බෑව - පාමංකඩ මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා ඉඩම් කැබලි 1,257 ක් අත්පත් කර ගෙන තිබු අතර 2014 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 1,736.7 ක මුදල් ගෙවා තිබුණි. වන්දි ගෙවීම සඳහා ඉඩම් කැබලි 1,338 ක් පමණක් සුදුසුකම් ලබා තිබු බව නිරීක්ෂණය විය. තවද, වන්දි ගෙවීම් මත රු. මිලියන 2.6 ක පොලියත්, එම වන්දි ගෙවීම් වල ඇතුළත්ව තිබුණි.